**ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා
නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය සඳහා තාවකාලික පදනමින් පත් කිරීමට නියමිත පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

*තනතුර* : නිශ්චල ඡායාරූප ශිල්පී - තනතුරු සංඛ්‍යාව - 01
වීඩියෝ කැමරා ශිල්පී - තනතුරු සංඛ්‍යාව - 01

*තනතුරේ ස්වභාවය* : තාවකාලික.

*වැටුප* : මාසික දීමනාව රු. 29,840 සහ රු. 7,800කින් යුත් ජීවන වියදම් දීමනාවකි.

*අධ්‍යාපන සුදුසුකම්* : අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 04කට සම්මාන සහිතව එක්වරකදී විෂයයන් (06)කින් සමත්වීම.

*වෘත්තීය සුදුසුකම්* : ඡායාරූපකරණය සහ වීඩියෝ කැමරාකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් NVQ මට්ටම 05ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

*තනතුර* : කැමරා ශිල්පී සහායක - තනතුරු සංඛ්‍යාව 01

*තනතුරේ ස්වභාවය* : තාවකාලික

*වැටුප්* : මාසික දීමනාව රු. 24,250 සහ රු. 7,800කින් යුත් ජීවන වියදම් දීමනාවකි.

*අධ්‍යාපන සුදුසුකම්* : අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

වෘත්තීය සුදුසුකම් : අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

බඳවාගැනීමේ ක්‍රමය : යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් උපරිම සුදුසුකම්ලත් තැනැත්තන් බඳවාගනු ලැබේ. වෙනත් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ විස්තර සහිතව පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟින් ලියාපදිංචි කළ තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට *2021.07.16 දින හෝ ඊට පෙර එවිය යුතුය.* අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අත්සන් තබා නොමැති අයදුම්පත් හා ඉහත සඳහන් සුදුසුකම් සහ සහතිකපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ
බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

අංක 45, ලේඩීන් බැස්ටියන් පාර,
කොළඹ 01,
2021 ජුනි මස 25 වැනි දින.